01) පාඩම හෝ ඒකකය - 6.1.1. එම්. සාර්ලිස් ශිල්පියාගේ සිතුවම් අගයමු

02) ඉගෙනුම් ඵල -

- එම්. සාර්ලිස් ශිල්පියාගේ නිර්මාණවල කාලීන වැදගත්කම සොයා බලයි.
- විහාර සිතුවම් හා ලිතෝ මුද්‍රණ වශයෙන් එම්.සාර්ලිස්ගේ නිර්මාණ හඳුනා ගනියි.
- නව නිර්මාණාත්මක ශෛලිය සඳහා පදනම් වූ ආභාස විමසා බලයි.
- නිර්මාණ ආශ්‍රිත ව සංරචන ක්‍රම හා සිද්ධාන්ත ලක්ෂණ විස්තර කරයි.
- එම්. සාර්ලිස් ශිල්පියාගේ චිත්‍රවල කලා ලක්ෂණ ඇගයීමට ලක් කරයි.

03) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

- එම්. සාර්ලිස් ශිල්පියාගේ නිදර්ශන චිත්‍ර පිළිබඳ අවධානයට යොමු කරන්න.
- එම සිතුවම්වල ආභාසය, වස්තු විෂයය, ශෛලිය පිළිබඳ ව අවබෝධයක් ලබා ගන්න.
- බටහිර චිත්‍ර කලා ශෛලිය අනුගමනය කරමින් ශ්‍රී ලාංකේය සංස්කෘතිය රැකගැනීම පිණිස බෞද්ධ සිතුවම් ඇඳ ඇති අකාරය අධ්‍යයනය කරන්න.
- පහත ලබා දී ඇති කියවීම් පත්‍රිකාව අධ්‍යයනය කර ඒ ඇසුරෙන් කාර්ය පත්‍රිකාවේ ඇති ක්‍රියාකාරකමෙහි නිරත වන්න.
- පාසල ආරම්භ වූ පසු ඔබගේ අනාවරණය පන්ති කාමරයේ ඉදිරිපත් කරන්න.

**<u>කාර්ය පත්‍රිකාව</u>**

1) එම්. සාර්ලිස්ගේ නිර්මාණවල පවතින සුවිශේෂී ලක්ෂණ නම් කරන්න.

2) එම්. සාර්ලිස් ශිල්පියා පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

3) පහත සඳහන් කරුණු යටතේ එම්. සාර්ලිස් ශිල්පියාගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.

- තේමාව
- ශෛලිය
- අභාසය
- ශිල්ප ක්‍රමය
- කලා ලක්ෂණ(රූප භාවිතය/ වර්ණ භාවිතය/ තලය භාවිතය)

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - Course : 10 ශ්‍රේණිය චිත්‍ර කලාව - https://www.enenapiyasa.lk
- ගුරු ගෙදර - නැත
- වෙනත් - (YouTube) - https://youtu.be/WystvdUqE7c
  https://youtu.be/GOzWBKhk1Bo
  https://youtu.be/oMv5M5YkXjE
  https://youtu.be/Cly34m1MEiA
  https://youtu.be/5zdYiepCWrU
- කියවීම් පත්‍රිකාව -

– ටවර් නෘත්‍ය ශාලාවේ චිත්‍ර වස්ත්‍ර සකස් කළ රිචඩ් හෙන්රිකස්ගේ බටහිර චිත්‍ර කලා ශෛලීය ලක්ෂණ එම්. සාර්ලිස්ගේ බෞද්ධ චිත්‍ර නිර්මාණ සඳහා ආභාසය විය.

– එම්. සාර්ලිස් ශිල්පියාගේ බෞද්ධ සිතුවම් නිර්මාණ, විහාර සිතුවම් හා ලිතෝ මුද්‍රිත සිතුවම් ලෙස කොටස් දෙකකට බෙදා වෙන් කළ හැකි ය.

– ඔහු විසින් අඳින ලද බෞද්ධ සිතුවම් 1923 දී ජර්මනියට යවා ලිතෝ මුද්‍රිත ක්‍රමයෙන් පිටපත් ලබා ගැනිණ. එවැනි සිතුවම් 36 කි. සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය, පියුම් පිට වැඩීම, ශිල්ප දැක්වීම, සිදුහත් යශෝධරා සරණ මංගල්‍යය, සිදුහත් කුමරු හා මව් බිසව, දුෂ්කර ක්‍රියාව, සීවලී මහරහතන් වහන්සේ)

– එම්. සාර්ලිස් ශිල්පියා විසින් සිතුවම් ඇඳ ඇති බෞද්ධ විහාරස්ථාන කිහිපයකි. එනම් කොළඹ මාලිගාකන්ද විහාරය, ඉඳුරුවේ යාලගම විහාරය, මතුගම පාන්තිය ශ්‍රී මංගල විහාරය.

– එම්. සාර්ලිස් ශිල්පියාගේ සිතුවම්වල දැකිය හැකි කලා ලක්ෂණ ලෙස මනා සම්පිණ්ඩනය පර්යාලෝක ලක්ෂණ දැක්වීම එළිය අඳුර හා ත්‍රිමාන ලක්ෂණ දැක්වීම දීප්තිමත් වර්ණ භාවිතය ගත හැකිය

05) අතිරේක පොත්/සගරා -

- 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- චිත්‍ර කලාව - රුවන්ති කුරේ
- පූජිත සිත්තරු - සොලමන් ප්‍රේමානන්ද

**සැකසුම - නම - කේ.කේ.කේ.එච්.එච්.එච්. පොල්වත්ත.**

**අධ්‍යාපන ආයතනය - කෑ/දෙහි/ නක්කාවිට ක.වි.**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**